# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෂෙ

අංක 2314/05 – 2023 ජනවාරි 09 වැනි සඳුදා – 2023.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/115.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.12.28 දිනැති හා අංක 2208/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ආනන්ද රාජකරුණා මාවත, අංක 141 හි පිහිටි නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය සහ නුගේගොඩ, චැපල් පාර, අංක 37 හි පිහිටි රීගල් කැලිබර් ලංකා ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.12.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය

1. නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය
අංක 141,ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

*පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු.*

*නඩු අංකය*: A/74/2020
යොමු අංකය: IR/COM/05/2017/115.

*එදිරිව,*

රීගල් කැලිබර් ලංකා ලිමිටඩ්,
අංක 37,චැපල් පාර,
නුගේගොඩ.

*දෙවැනි පාර්ශ්වයේ.*
*වගඋත්තරකරු.*

*වර්ෂ 2022 ක්වූ දෙසැම්බර් මස 06 වන දින දීය.*

<u>ප්‍රදානය</u>

කම්කරු අමාත්‍ය, ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

*ආරාවුලට තුඩු දුන් කාරණය ඃ*

රීගල් කැලිබර් ලංකා ලිමිටඩ් ආයතනයේ සේවකයින්ට සෑම වර්ෂයකම අප්‍රේල් මස ගෙවන ලද මාසික ප්‍රසාද දීමනාව වර්ෂ 2017 අප්‍රේල් මස නොගෙවීම මගින් හා 2017 අප්‍රේල් මස 20 වන දින සිට 2017 අප්‍රේල් මස 26 වන දින තෙක් පැවති වැඩ වර්ජනයට සහභාගී වීම හේතුවෙන් එම සේවක සේවිකාවන්ගේ 2017 අප්‍රේල් මස පැමිණීමේ දීමනාව අහිමි කිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ. බේරුම්කරණ අංක A 21/2018 යටතේ ද මෙම කරුණ සම්බන්ධයෙන් විමසීමක් සිදුකොට සාක්ෂි විභාගය අවසන් කොට සාක්ෂි සටහන් වල වැරදි නිවැරදි කොට ලිඛිත දේශන සඳහා ද යොමු කොට තිබිණි.

වර්ෂ 2021 ක්වූ මාර්තු මස 18 වන දින මෙම බේරුම්කරණය කැඳවූ අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශ්වයේ ඉල්ලීම වූයේ දැනට මෙම කරුණට අදල සාක්ෂි විමසීම අවසන් කොට සාක්ෂි සටහන්වල ඇති වැරදිද නිවැරදි කොට ලිඛිත දේශන ගොනු කිරීම සඳහා යොමු කොට තිබූ බැවින් මෙම ඉල්ලීමටද අදල වන්නේ එම සාක්ෂි සටහන් බැවින් ලිඛිත දේශන ගොනු කිරීම සඳහා දිනයක් ලබාදෙන ලෙසයි.

නමුත් වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා දන්වා සිටියේ විමසීම නැවත මුල සිට විභාග කර ප්‍රදන තීන්දුව ලබා දීමට කටයුතු කරදෙන ලෙසත්ය. ඒ අනුව දෙපාර්ශ්වයේ කරුණු සලකා බලා ඉල්ලුම්කාර පාර්ශ්වයේ ඉල්ලීම සම්බන්ධයෙන් වගඋත්තකාර පාර්ශ්වය විරුද්ධ වූ බැවින් මෙම බේරුම්කරණය මුල සිට නැවත ඇසීමට තීරණය කරන ලදී.

ඒ අනුව වර්ෂ 2022 ක්වූ මාර්තු මස 07 වන දින මෙම බේරුම්කරණය කැඳවූ අවස්ථාවේදී ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය නියෝජනය කරමින් නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවක සංගමයේ සමලේකම් වශයෙන් කටයුතු කරන ඩී. එම්. අසේල ධර්මප්‍රිය දිසානායක මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශ්වය නියෝජනය කරමින් රීගල් කැලිබර් ලංකා ලිමිටඩ් හි සමූහ මූල්‍ය කළමණාකරු වන ගල්ලත් රාළලාගේ ශාන්ත මහතා පෙනී සිටින ලදී.

ඉල්ලුම්කාර වෘත්තිය සමිතිය වෙනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ මෙම බේරුම්කරණය සඳහා ඉල්ලුම්කාර වෘත්තිය සමිතියෙන් ඉල්ලීමක් කර තිබූ සංගමයේ සාමාජිකයින් මේ සඳහා උනන්දුවක් නොදක්වන බැවින් තවදුරටත් මෙම බේරුම්කරණය පවත්වාගෙන යාමට අවශ්‍යතාවයක් නොමැති බවයි.

ඒ බව සංගමයේ සියලුම නිලධාරින් විසින් සාකච්ඡා කර තීරණය කර ඇති බවත් ගරු බේරුම්කරණයට දන්වා සිටින ලදී.

මීට පෙර මෙම බේරුම්කරණය සඳහා නිදහස් වෙළඳ කලාප හා පොදු සේවක සංගමය වෙනුවෙන් එහි සංවිධායක ලලිත් කරුණාතිලක සහ ශාන්ත ලියනාරච්චි සංවිධායක පැමිණ ඇති අතර සංගමයේ නීතිඥ ලෙස ලීලානන්ද මහතා පෙනී සිටි අතර නමුත් ඒ අවස්ථාවේදී නොවැළැක්විය හැකි හේතුවක් මත මීට පෙර සහභාගී වූ සංගමයේ නියෝජිතයින් පෙනී නොසිටින ලදී.

නමුත් සංගමයේ පූර්ණ අනුදැනුම මත සංගමයේ සම ලේකම් වශයෙන් කටයුතු කරන ඩී. එම්. අසේල ධර්මප්‍රිය දිසානායක යන අය මෙම බේරුම්කරණය ඉදිරියේ පෙනී සිටි අතර මෙම බේරුම්කරණය ඉවත් කරවා ගැනීම සම්බන්ධව සංගමය පැත්තෙන් යම්කිසි විරෝධතාවයක් ඇතිවන්නේ නම් ඒ සම්බන්ධව ඔහු වගකීම දරන බවත් බේරුම්කරණය වෙත දන්වා සිටින ලදී. වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ දිනේෂ් චාමිකර යන අය අසනීප තත්වය නිසා පෙනී නොසිටින බවත් බේරුම්කරණ ඉල්ලීම ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් ඔවුන් විරෝධතාවයක් නොදක්වන බවයි.

ඒ අනුව පළමුවන පාර්ශ්වය මෙම ඉල්ලීමට අදාලව නිදහස් වෙළඳ කලාප හා පොදු සේවා සේවක සංගමය වෙත උපදෙස් ලබා දී නොමැති බැවිනුත්, ඔවුන් මෙම ඉල්ලීම මින් ඉදිරියට පවත්වාගෙන යාම සම්බන්ධයෙන් උනන්දුවක් නොදක්වන බැවිනුත් මෙම බේරුම්කරණ නඩුවේ පළමුවන පාර්ශ්වය මින් ඉදිරියට මෙම බේරුම්කරණය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් උනන්දුවක් නොදක්වන බැවිනුත් උපදෙස් නොමැති බව දන්වන බැවිනුත් ඉහත සඳහන් සියලු කරුණු අනුව මෙම බේරුම්කරණයට පෙනී යන්නේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු උනන්දුවක් නොදක්වන බවයි. එහෙයින් මෙම ඉල්ලීම නිශ්ප්‍රභ කරමි.

**නීතිඥ ප්‍රියන්ත අමරසිංහ,**
බේරුම්කරු.

2022 දෙසැම්බර් මස 06 වැනි දින.

EOG 01 - 0055

---

මගේ අංකය: IR/COM/03/2016/143.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.09.28 දිනැති හා අංක 2299/44 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.09.08 දින දරන නියෝග යෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පරකඩුව, තලාවිටිය, "ශාන්ති", හි පදිංචි සීතා විජේසූරිය මිය, සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ගෝල්ෆේස් ටෙරස්, අංක 25, කොළඹ 03 අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.12.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය කොළඹ.**

සීතා විජේසූරිය,
"ශාන්ති",
තලාවිටිය,
පරකඩුව,

*පැමිණිලිකරු*

*ආරාවුල් අංකය:* IR/COM/03/2016/143.
*බේරුම්කරණ අංකය:* A/56/2022.

එදිරිව

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය,
අංක 25,
ගෝල්ෆේස් ටෙරස්,
කොළඹ 03.

*වගඋත්තරකරු*

2022 දෙසැම්බර් මස 02 දින දී ය.

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :

"රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය කළ සීතා විජේසූරිය මිය 1994 වර්ෂයේ එම සංස්ථාව, අධිකාරියක් බවට පත් කිරීමේ දී අතිරික්ත සේවිකාවක් වශයෙන් සලකා නියමිත වයස එළඹෙන්නට ප්‍රථම පොදු වන්දි ක්‍රමය යටතේ සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත් වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ගණනය කිරීමට බුළුමුල්ල වන්දි ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ."

**පසුබිම**

මෙම ආරාවුල 2018.07.24 දිනැති අංක IR/COM/03/2016/143 සහ ලිපිගොනු අංක A/49/2018 යටතේ බේරුම්කරණය සඳහා බේරුම්කරු එස්. කාරියවසම් මහතා වෙත යොමු කර තිබුණු අතර මෙම ආරාවුල මුල්වරට කැඳවූ අවස්ථාවේ දී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා සම්බන්ධයෙන් ලිඛිත දේශණ ඉදිරිපත් කරන ලෙසට දෙපාර්ශ්වයට දැනුම්දෙනු ලදුව එකී පාර්ශ්වයන් විසින් ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත. එස්. කාරියවසම් මහතා මෙම ආරාවුල බේරුම්කරණ කටයුතු සිදුකිරීමෙන් ඉවත් වී තිබුණි. ඉන් අනතුරුව මෙකී බේරුම්කරණය 2020.11.18 දිනැති අංක IR/COM/03/2016/143 සහ ලිපිගොනු අංක A/67/2020 යටතේ පරීක්ෂණය සිදුකිරීමට නව බේරුම්කරුවෙකු වශයෙන් ඩී. ජී. කේ. කරුණාරත්න මහතා වෙත යොමු කර තිබූ අතර මෙම පරීක්ෂණ කටයුතු ඔහු විසින් මෙහෙයවා නොතිබූ අතර නැවත මෙකී බේරුම්කරණය 2021.04.01 දිනැති අංක IR/COM/03/2016/143 සහ ලිපිගොනු අංක A/43/2021 යටතේ පරීක්ෂණය සිදුකිරීමට නව බේරුම්කරුවෙකු වශයෙන් නීතිඥ පාරින්ද මනෝජ් වීරසිංහ මහතා පත්කර ඇති අතර ඔහු විසින් ද මෙකී බේරුම්කරණයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. ඉන්පසු මෙකී බේරුම්කරණය 2022.09.09 දිනැති අංක IR/COM/03/2016/143 සහ ලිපිගොනු අංක A/56/2022 යටතේ මා වෙත යොමුකර තිබුණි.

ඒ අනුව මෙම ආරාවුල 2022.10.14 වන දින මුල්වරට මා ඉදිරියේ කැඳවන ලදී. මෙම පරීක්ෂණය බේරුම්කරු එස්. කාරියවසම් මහතා ඉදිරියේ කැඳවන ලද අවස්ථාවේ දී දෙපාර්ශ්වය විසින් ගොනු කරන ලද ලිඛිත දේශන සහ සාක්ෂි මෙම පරීක්ෂණය සඳහා ආවේශ කර ගැනීමට දෙපාර්ශ්වය විසින් ලිඛිතව එකඟතාවය ලබා දී තිබුණි. ඒ අනුව වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලැබ තිබූ මූලික විරෝධතා සම්බන්ධයෙන් නැවත ප්‍රතිවිරෝධතා ගොනු කිරීමට පැමිණිලිකාර පාර්ශ්වයට අවස්ථාව ලබාදුනි.

පැමිණිලිකාර පාර්ශ්වය විසින් එකී ලිඛිත විරෝධතාවයන්ට එරෙහි ප්‍රතිවිරෝධතා 2018.10.01 දිනැතිව බේරුම්කරු එස්. කාරියවසම් මහතා වෙතද 2022.11.09 වෙනි දින මා වෙත ද ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර පාර්ශ්වය විසින් සිය පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇති ස්ථාවරයන් සහ ඉල්ලා ඇති සහන පහත පරිදි සම්පිණ්ඩනය කළ හැකිය.

01. පැමිණිලිකාරිය 1972.01.26 දින දරන පත්වීම් ලිපිය අනුව රාජ්‍ය මැණික් සංස්ථාවේ කනිෂ්ඨ ලිපිකරු සේවයට පත්වීමක් ලබා ඇති බව,

02. 1994 දී රාජ්‍ය මැණික් සංස්ථාව අධිකාරියක් බවට පත්වීමේ දී අතිරික්ත සේවිකාවක් ලෙස සළකා නියමිත වයස එළඹෙන්නට ප්‍රථම සේවක අර්ථසාධක මුදල් ලබා පොදු වන්දි ක්‍රමය යටතේ සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත් වූ බව,

03. පැමිණිලිකාරිය වසර 22 කට වැඩි කාලයක් එකී සංස්ථාවේ සේවය කළ බව,

04. පැමිණිලිකාරිය සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත්වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තීරණය කිරීමට බුලුමුල්ල වන්දි ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදු වී ඇති බව,

05. අංක 1886/6 සහ 2014.10.27 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් කාර්මික ආරාවුල් පනතට යටත්ව රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය කළ රංජිත් ලියනගේ මහතාට මාස 50 ක වැටුප් වන්දි මුදලක් වශයෙන් ගෙවිය යුතු බවට ප්‍රදානයක් ලබා දී ඇති බවත්, එකී රංජිත් ලියනගේ මහතා විසින් සපුරාලන සියලුම කුසලතා පැමිණිලිකාරිය විසින් සම්පූර්ණ කර ඇති බව,

06. ඒ අනුව රාජ්‍ය මැණික් සංස්ථාව අධිකාරියක් බවට පත්කිරීමේ දී බුලුමුල්ල වන්දි ක්‍රමය උපයෝගි කර ගැනීමෙන් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදු වී ඇති බව,

07. පැමිණිලිකාරිය අතිරික්ත සේවිකාවක් ලෙස සළකා වයස එළඹීමට පෙර සේවක අර්ථසාධක මුදල් මුද හැර අවුරුදු 22 කට වඩා වැඩි සේවා කාලය සළකා මාස 50 ක වැටුප වන්දි මුදලක් ලෙස ලබාගැනීමේ හිමිකමක් ඇති බව,

08. මීට සමාන අවස්ථාවල දී අනෙකුත් ආයතනවල සේවකයන්ට මාස 50 ක වැටුපක් වන්දි මුදලක් ලෙස ගෙවා ඇති බව,

09. ඒ අනුව පැමිණිලිකාරියට මාස 50 ක වැටුප් වන්දි මුදල ද, ඊට අමතරව යම් සහනයක් දිය හැකි නම් එවැනි සහනයන්ද ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව,

වගඋත්තරකාර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් එච්. ජී. සුමනසේකර මහතා විසින් බේරුම්කරණ පරීක්ෂණයේ මුල් අවස්ථාවේ දීම 2018.09.06 දිනැති ව ගොනු කරන ලද මූලික විරෝධතා සහ පැමිණිලිකාර පාර්ශ්වය විසින් 2018.09.01 දිනැතිව ඉදිරිපත් කර ඇති ප්‍රකාශයට පිළිතුරු ලෙස 2018.10.08 වැනි දින ගොනුකර ලැබ ඇති ලිඛිත දේශන මගින් පහත මූලික විරෝධතා ඉදිරිපත් කර ඇත.

අ. මෙකී ආරාවුල සජීවී කම්කරු ආරාවුලක් නොවන බව,

ආ. ඉල්ලුම්කාරිය සේවයෙන් ඉවත් වී වසර 22 කට පසුව ගොනු කරන ලද ප්‍රමාද වූ ඉල්ලුම්පත්‍රයක් බව,

එකී විරෝධතා මගින් වගඋත්තරකාර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ඉල්ලා සිටින්නේ මෙම පැමිණිල්ල මුල් අවස්ථාවේම ප්‍රතික්ෂේප කොට නිෂ්ප්‍රභා කළ යුතු බවත් ය.

පැමිණිල්ල මගින් සහ පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කර ඇති විරෝධතා සහ ප්‍රතිවිරෝධතා පිළිබඳ නෛතික පසුබිම පහත විශ්ලේෂණය කරමි.

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 48 අර්ථ නිරූපන වගන්තියේ "සේවකයා" පිළිබඳ වන අර්ථ නිරූපණය මෙසේ දක්වා සිටිමි.

> ***" workman" means any person who has entered into or works under a contract with an employer in any capacity, whether the contract is expressed or implied, oral or in writing, and whether it is a contract of service or of apprenticeship, or a contract personally to execute any work or labour, and includes any person ordinarily employed under any such contract whether such person is or is not in employment at any particular time, and includes any person whose services have been terminated."***

එකී වගන්තියේ පැහැදිලිවම දක්වා ඇත්තේ "and includes any person whose services have been terminated." ඒ අනුව සේවය අවසන් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකුද ඊට ඇතුළත් වේ.

මෙහි දී මූලිකව විසඳිය යුතු කරුණු වන්නේ මෙම බේරුම්කරණයට අදාළව පැමිණිලිකාර පාර්ශ්වය ඉහත නිර්වචනයේ දක්වා ඇති **"සේවය අවසන් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු"** යන නිර්වචනය තුළට ඇතුළත් කළ හැකි ද නොහැකි ද යන්න සහ මෙය **"සජීවී ආරාවුලක්"** වන්නේ ද නොවන්නේ ද යන්න පිළිබඳව තීරණය කළ යුතු බවයි.

වගඋත්තරකාර පාර්ශ්ව විසින් 2018.09.06 දින ඉදිරිපත් කරන ලද සිය ලිඛිත විරෝධතා මගින් ඉදිරිපත් කර ඇති පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරමි.

> "කම්කරු ආරාවුලක් කම්කරුවා සහ සේවායෝජකයා අතර හට ගත යුත්තේ තෙවන පාර්ශ්වයක් තමාට කම්කරු ආරාවුලක් ඇති බවට කරුණු නියෝජනය කිරීමෙන් පසුව නොවේ. තෙවන පාර්ශ්වය තමාට විසඳාගත යුතු ආරාවුලක් සේවායෝජක සමග ඇති බවට කරුණු නියෝජනය කිරීමෙන් පසු තමාට ද විසඳාගත යුතු ආරාවුලක් ඇති බවට පැමිණිලි කරනවා යනු සැබැවින්ම සජීවී ආරාවුලක් නොමැති බවට සාක්ෂියකි.
>
> මෙම ප්‍රශ්නගත සිදුවීමේ දී ද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සේවකයෙක්ව සිට, 1994 අන්තර්ග්‍රහණයේ දී ස්ව කැමැත්තෙන් සේවයෙන් වන්දි ලබා ඉවත් වූ රංජිත් ලියනගේ යන අය තමාට වන්දි ලබාදීමේ දී අසාධාරණයක් වූ බවට කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඉන් අනතුරුව 2014 වර්ෂයේ බේරුම්කරණ පර්ෂදයක් මගින් අවසන් තීරණයක් ලබා ගැනීමෙන් අනතුරුව රංජිත් ලියනගේ යන අය සමග ඉවත් වූ ඉහත කී පැමිණිලිකාරියට විසඳාගත යුතු කම්කරු ආරාවුලක් ඇති බවට මතකයට නැගී තිබීම හාස්‍යයට කරුණකි" (2 පිටුව)
>
> " එක්වරම තම සගයෙක් තමාට ආසාධාරණයක් සිදු වූ බවට 1994 වර්ෂයේ සිට සිදුකළ පැමිණිල්ලකට 2014 වර්ෂයේ වාසි සහගත තීරණයක් ලැබීම හේතුවෙන් සහ එකී තීරණය ද ලැබී අවුරුදු දෙකකටත් වැඩි කාලයක් ගත වූ පසු එකී වාසිය තමන් ද උරගා බැලීමට තවත් පැමිණිලිකරුවන් 10 දෙනෙකුගේ ඉල්ලීම් ඉදිරිපත් කර තිබීම හේතුවෙන් නෛතික ප්‍රතිපාදන නොසලකා ඔබ ආයතනයට හුදු පැමිණිල්ලක් සිදුකර ඇති බව කාරුණිකව ඔබගේ අවධානයට යොමු කර සිටිමි." (3 පිටුව)

වගඋත්තරකාර පාර්ශ්වය මෙහි දී දක්වා ඇත්තේ මෙකී පැමිණිලිකාරියට වලංගු සජීවී කම්කරු ආරාවුලක් නොමැති බවත් රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවකයකු වූ රංජිත් ලියනගේ යන අයට බේරුම්කරණයක් මගින් සහන ලැබීම හේතුවෙන් එකී තුන්වන පාර්ශ්වයට ලැබී ඇති හිමිකම පදනම් කර ගෙන පැමිණිලිකාරියට ද සහන ලැබිය යුතු බවට ඉල්ලීමක් සිදුකර ඇති බවයි.

මේ පිළිබඳව සැලකීමේ දී වගඋත්තරකාර පාර්ශ්වය විසින් සිය ලිඛිත මූලික විරෝධතා මගින් දක්වා ඇති තුන්වන පාර්ශ්වයක හිමිකමක් පදනම් කරගෙන පැමිණිලිකාරියගේ ඉල්ලීම් සිදුකර ඇති බවට වන ස්ථාවරය සනාථ වන අයුරින්ම පැමිණිලිකාරිය විසින් එකී ස්ථාවරය 2018.09.01 දින ඉදිරිපත් කරන ලද පළමු ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇත.

> "අංක 1886/6-2014.10.27 *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් කාර්මික ආරාවුල් පනතට යටත්ව රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය කළ රංජිත් ලියනගේ මහතාට එහිදී ප්‍රදානය කරන ලද මාස 50 ක වැටුප් වන්දි මුදල් වශයෙන් ලබාදීමේ දී ඔහු විසින් සුපුරාලන ලද සියළුම කුසලතා මා විසින් සම්පූර්ණ කර ඇති බැව් කාරුණිකව දන්වා සිටිමි."

මෙහි දී වගඋත්තරකාර පාර්ශ්වය සිය ලිඛිත දේශන මගින් ඉදිරිපත් කර ඇති *The State Bank of India Vs. Sundaralingam 73NLR514* නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති තීන්දුව සහ එකී නඩුවේ සිද්ධිමය කරුණු දෙසට අවධානය යොමු කරමි.

> "One Thuraisingham, a Sub Accountant employed by the petitioner Bank, retired from the service of the Bank on 10th April 1962. Sixteen months later, on 15th August 1963, the 2nd Respondent Union on his behalf and that of other Sub- Accountants applied for the benefits of a salary revision subsequent to the orders in I.D. 306 and I.D. 306A. In the application, the 2nd Respondent included an application for revision of pension and the consequent arrears of salary and pension.
>
> The Award in I.D. 306 and its clarification I.D. 306A contains no order or direction affecting the salaries or payment of increments to Sub-Accuntants and consequently, the awards in these two Disputes have no application to Thuraisingham. Indeed at the arbitration proceedings first held before M. R. A. Carim (Arbitrator) on 12th October 1966, the 2nd Respondent Union specifically admitted that the award in I. D. 306 did not apply to Thuraisingham."

මෙම නඩුවේ දී සුන්දරලිංගම් යන අය සහකාර ගිණුම්කරුවෙකු වශයෙන් සේවය කර 1962.04.10 දින සිට සියලුම දීමනා ලබා විශ්‍රාම යන ලදී. සුන්දරලිංගම් ගේ වැටුප් ශ්‍රේණියේ සිට තවත් සහකාර ගිණුම්කරුවන් කිහිපදෙනෙක් වැටුප් දීමනා ප්‍රතිශෝධනය

කිරීමේ ඉල්ලීමක් සිදුකරන ලදී. එකී ඉල්ලීම පිළිගනිමින් බේරුම්කරණ තීන්දුවක් (I.D. 306 & 306A) ලැබීමෙන් අනතුරුව ඉන් මාස 16 කට පසු සුන්දරලිංගම් යන අය සේවායෝජක ආයතනයෙන් ඉල්ලා සිටියේ I.D. 306 හි තීන්දුව අනුව යමින් ඔහුගේ ද විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය විය යුතු බවයි. මෙහි දී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරනු ලැබුවේ එකම වැටුප් ශ්‍රේණියේ සිටි වෙනත් සහකාර ගිණුම්කරුවන් කිහිපදෙනෙකු විසින් පවරා ඇති I.D. 306 & 306A බේරුම්කරණයන් මගින් ලැබුණු තීන්දුව එකී බේරුම්කරණයේ පාර්ශ්වකරුවෙකු නොවන සුන්දරලිංගම් සඳහා අදාළ නොවන බවයි.

ඉහත නඩුවේ හරය මෙම බේරුම්කරණයට අදාළ ප්‍රස්තුත හරය එක සමානභාවයකින් යුක්ත වන අතර <u>*The State Bank of India Vs. Sundaralingam 73NLR514*</u> නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදී ඇති තීරණය අනුව යමින් තුන්වන පාර්ශ්වයකට බේරුම්කරණයක දී යම් හිමිකමක් ලැබීම මත එකී බේරුම්කරණ තීන්දුව මත තවත් පාර්ශ්වයකට හිමිකමකට අයිතිවාසිකමක් හිමි නොවන බව තීරණය කරමි.

තව ද වගඋත්තරකාර පාර්ශ්වය විසින් සිය ලිඛිත මූලික විරෝධතාවයන්ට අගති විරහිතව දක්වා ඇති සෙසු නෛතික සැළකිරීම් කෙරෙහි මාගේ අවධානය යොමු කරමි. එහි දී මා විසින් සම්පිණ්ඩනය කරගත් කරුණු පහත පරිදි දක්වා සිටිමි.

1. පැමිණිලිකාරිය රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවිකාවක් ව සිට ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියට අන්තර්ග්‍රහණය කිරීමේ දී 1994 වර්ෂයේ ස්ව කැමැත්තෙන් ඉවත් වීමට කැමැත්ත ලබා දී බුලුමුල්ල වන්දි ක්‍රමය යටතේ වන්දි ලබාගැනීමට එකඟව වන්දි ලබාගෙන ඉවත් වූ සේවිකාවක් බවත් ඇයට වගඋත්තරකාර ආයතනය සමග සජීවී කම්කරු ආරාවුලක් නොතිබූ බව.

පැමිණිලිකාරිය විසින් 2018.09.01 දින ගොනු කරන ලද පළමු ප්‍රකාශය සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම් අංක 06 - 'ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අන්තර්ග්‍රහණය කිරීම' මැයෙන් වන ලිපිය අනුව පෙනී යන්නේ පැමිණිලිකාරිය එකී අධිකාරියේ VI ශ්‍රේණියේ තනතුරකට පත් කර ඇති බවත්, වර්තමාන වැටුප එලෙසම ක්‍රියාත්මක වන බවත්, සේවා කාලය ගණනය කිරීමේ දී රාජ්‍ය මැණික් සංස්ථාවේ අඛණ්ඩ සේවා කාලය ගණනය කරන බවත් දක්වා ඇත. තව ද එකී පැමිණිල්ල සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම් අංක - 02 'ස්වේච්ඡාවෙන් සේවය අවසන් කිරීම' යන ලිපිය මගින් දක්වා ඇත්තේ පැමිණිලිකාරිය විසින් 1994.03.21 දිනැතිව සිය කමැත්තෙන් සේවයෙන් ඉවත්වීම සඳහා අයදුම් පත්‍රයක් යොමු ඉදිරිපත් කර ඇති බවත් ය.

ඒ අනුව පෙනී යන්නේ පැමිණිලිකාරිය ස්වේච්ඡාවෙන් වන්දි ලබා ඉවත් වූ සේවකාවක් වන බව ය. පැමිණිලිකාරිය සහ වගඋත්තරකාර ආයතනය අතර වන්දි ගණනය කිරීම සහ ලබා ගැනීම සම්බන්ධයෙන් කිසිදු කාර්මික ආරාවුලක් පැවති බවට වන පිළිගත හැකි කිසිදු සාක්ෂියක්, ලේඛනයක් පැමිණිල්ල සමග හෝ ලිඛිත ප්‍රති විරෝධතා සමග හෝ ඉදිරිපත් කර නොමැති අතර ඇමුණුම් අංක 07 සහ ලිඛිත ප්‍රතිවිරෝධතා ප්‍රකාශයේ A1 - 'වන්දි මුදල ගෙවීම සම්බන්ධවයි' වූ ලිපි ශීර්ෂය සහිත 98.02.23 දිනැතිව වගඋත්තරකාර පාර්ශ්වයේ සභාපතිවරයා අමතන ලද ලිපියක ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කර ඇති අතර, එකී ලිපිය මගින් වන්දි ලබාදීම සම්බන්ධයෙන් වන ආරාවුල කුමක් දැයි නිශ්චිතව දක්වා නැත.

2. පැමිණිල්ල ප්‍රමාද ව ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් වන බව.

පැමිණිලිකාරිය විසින් 2016.10.10 වැනි දින තෙක් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැත. 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යටතේ සහන ලබා ගැනීම සඳහා ඉල්ලුම්කරුවෙක් සාධාරණ හා යුක්ති සහගත කාලයක් තුළ පැමිණිල්ල සිදුකළ යුතු වුවත්, මෙකී පැමිණිල්ල කම්කරු දෙපාර්තමේන්තුවට මුල්වරට ඉදිරිපත් කර ඇත්තේ වසර 22 කට පසුව ය. එකී ප්‍රමාදය සම්බන්ධයෙන් පිළිගත හැකි සාධාරණ යුක්ති සහගත හේතුවක් පැමිණිල්ල විසින් ඉදිරිපත් කර නොමැති අතර, 2018.09.01 දිනැති සිය පැමිණිල්ල පළමු ප්‍රකාශයේ (ඉ) මගින් දක්වා ඇත්තේ 'කම්කරු අධිකරණය පිළිබඳ අවබෝධයක් නොමැතිව මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට පිටපතක් සහිතව අධිකාරියේ සභාපතිවරයා වෙත දිගින් දිගටම දැනුම් දුනිමි' යනුවෙනි.

නීතිය පිළිබඳව නොදැනීම නිසා වසර 22 ක කාලයක් ගතවූ යැයි ප්‍රකාශ කිරීම සාධාරණ සහ යුක්ති සහගත හේතුවක් ලෙස පිළිගත නොහැකි ය. තව ද අධිකාරියේ සභාපතිවරයාට දිගින් දිගටම දැනුම් දුන් බව තහවුරු කිරීමට පිළිගත හැකි ප්‍රමාණවත් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති අතර එය හුදු ප්‍රකාශයක් පමණක් බව පෙනී යයි.

<u>**තීන්දුව**</u>

දෙපාර්ශ්වය විසින්ම ගොනු කරන ලද ලිඛිත දේශන සහ පැමිණිල්ල මගින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බැලීමෙන් අනතුරුව පහත තීරණයට එළඹියෙමි.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති මූලික විරෝධතා සහ ඉහත නෛතික සැලකිරීම් පිළිගැනීම මත මෙම ආරාවුල පරීක්ෂාකර ප්‍රදානයක් ලබාදීමට අධිකරණ බලය මෙම කාර්මික බේරුම්කරණ විනිශ්චය සභාවට නොමැති බවට තීරණය කරන ලද

අතර, මා වෙත යොමු කර ඇති ආරාවුල සම්බන්ධයෙන් තවදුරටත් පරීක්‍ෂණයක් පවත්වාගෙන යාමට මෙම බේරුම්කරණ අධිකරණයට බලයක් නොමැති බැවින් මෙම පරීක්‍ෂණ කටයුතු මෙයින් අවසන් කරමි.

ඒ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

බේරුම්කරු
නීතිඥ පියල් දර්ශන ගුරුගේ
2022 දෙසැම්බර් මස 02 වැනි දින.

EOG 01 - 0056

---

මගේ අංකය: IR/COM/02/2019/226.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.09.22 දිනැති හා අංක 2194/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.09.17 දින දරන නියෝග යෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තිස්සමහාරාම, ලූකස්ගොඩ, අංක 197 හි පදිංචි ඒ. කේ. පී. මහින්ද මයා, සහ කොළඹ 05, නාරාහේන්පිට, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.12.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/COM/02/2019/226.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

ඒ. කේ. පී. මහින්ද,
අංක 197,
ලූකස්ගොඩ,
තිස්සමහාරාමය.

*පළමු පාර්ශ්වය*

*නඩු අංකය:* A/41/2020.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

අතර කාර්මික ආරාවුල

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථකට පත් කිරීම සඳහා 2020.09.17 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

<u>ආරාවුලට තුඩුදුන් කාරණය</u>

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කතරගම ඩිපෝවේ රියැදුරෙකු ලෙස සේවය කල ඒ. කේ. පී. මහින්ද මහතා විසින් රුපියල් දෙසීය (රු.200/-) ක මුදලක් වංචා කළ බවට චෝදනා කර සේවය තහනම් කිරීම, අනුමැතියකින් තොරව උසස්වීම් ලිපි ලබා දී ඒ අනුව වැටුප් ගෙවා ඇති බවට චෝදනා කිරීම හා ලබා දී ඇති දඬුවම් සම්බන්ධව සහ 2004.07.01 දින සිට තනතුරු නාමය වෙනස්කර සේවයේ යෙදවීම සම්බන්ධව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ලබා දී ඇති දඬුවම් හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවී ද? එසේ වූයේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳවයි.

පසුබිම

ඉල්ලුම්කරු සීමා සහිත රුහුණු බස් සමාගමේ කතරගම ඩිපෝවේ ix ශ්‍රේණියේ ලිපිකරුවෙකු ලෙස 1978.02.15 දින සිට පත්වීම් ලබා ඇත. 1994.07.01 දින සිට vi වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ ඩිපෝ පරීක්ෂක තනතුරට උසස් කර ඇත. 2002.02.22 දින සිට සීමාසහිත රුහුණු බස් සමාගමේ iv වන ශ්‍රේණියේ සහකාර කළමණාකාර (මුදල්) තනතුර ආවරණය කිරීම සඳහා පත් වීම් ලබා දී ඇත.

2003.11.25 වන දින iv වන ශ්‍රේණියේ සහකාර කළමණාකාර තනතුරට ස්ථිර කර ඇත. ඉල්ලුම්කරුට රුපියල් 200 ක් දුරකථන බිල් පතක් නොගෙවීම සම්බන්ධයෙන් චෝදනා නගා 2004.09.08 වැනි දින සිට වේතන රහිතව සේවය තහනම් කර ඇත. 2020.10.01 වැනි දින ඉල්ලුම්කරු පළමු වෙනි ප්‍රකාශය ඉදිරිපත් කළ අතර වග උත්තරකරු වෙනුවෙන් 2021.01.20 වැනි දින උත්තර ප්‍රකාශ ඉදිරිපත් කරන ලදී.

2021.01.29 වැනි දින ඉල්ලුම්කරු දෙවන ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. 2021.02.23 වැනි දින විමසීම ආරම්භ කරන ලදී. එම අවස්ථාවේ දී වග උත්තරකාර පාර්ශ්වය මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරන ලද අතර, දෙපාර්ශ්වයටම මේ සඳහා ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.

දෙපාර්ශ්වය විසින් ගොනු කරන ලද ලිඛිත සැලකිරීම් සම්බන්ධයෙන් 2022.01.05 වැනි දින මූලික විරෝධතා ප්‍රතික්ෂේප කරමින් නඩුව වැඩි දුරටත් විසඳීමට තීරණය කරමින් නඩු තීන්දුව අවසානයේදී මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සලකා බැලීමට තීන්දු කරන ලදී.

2022.02.23 වැනි දින විමසීමට ගත් අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීති නිලධාරිනී ශානිකා ගාල්ලගේ මහත්මිය කරුණු දක්වමින් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන සොයා ගැනීමට අපහසුතාවයක් ඇති බව දන්වන ලදුව ඒ සම්බන්ධයෙන් සළකා බැලීමට කාලයක් ඇති බවත්, දැන්වීමෙන් පසු දෙපාර්ශ්වයේ කරුණු සළකා බලා ඉදිරි දිනයේ දී තීරණයක් කළ හැකි බව ම විසින් දෙපාර්ශ්වයට දන්වන ලදී.

2022.08.30 වැනි දින විමසීමට ගත් අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් කරුණු දක්වා කියා සිටියේ ඉල්ලුම්කරු වෙනුවෙන් පැවති විනය පරීක්ෂණය ලේඛන සොයාගැනීමේ අපහසුතාවයක් ඇති බවයි. එදින සැප්තැම්බර් මස 10 වන දිනට පෙර මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්නා ලෙසත්, එසේ නොකළහොත් ඉදිරිපත් කර ඇති ලේඛන මත තීරණයක් ගැනීමට සිදුවන බව ම විසින් දන්වන ලදී.

2022.11.22 වන දින විමසීමට ගත් අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ශානිකා ගාල්ලගේ මහත්මිය වග උත්තරකාර පාර්ශ්වය කොමිසමක් මගින් ඉදිරිපත් කර කරුණු දක්වා සිටී. එම කොමිසම් වාර්තාව අනුව ඉල්ලුම්කරු විසින් බේරුම්කරණයට ඉදිරිපත් කරන ලද ලේඛන වගඋත්තරකාර ආයතනයේ එනම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේඛන බවට පිළිගත්ත ද ඒවා ගැලපීම හා සැසඳීම මූල්‍යමය කාරණාවකට සම්බන්ධ බැවින් කිසිදු තීරණයක් කළ නොහැකි බව දන්වන ලදී.

උද වී ඇති තත්ත්වය අනුව විධිමත් විභාගයක් කළ නොහැකි බැවින් 2012.08.31 වැනි දින දෙපාර්ශ්වයටම දන්වා ඇති පරිදි ඉදිරිපත් කර ඇති ලේඛන මත නියෝගයක් කරමි. ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටි එම්. ඒ. දයාරත්න මහතා එක්තරා අවස්ථාවක දී සමථයක් වශයෙන් රුපියල් ලක්ෂ දෙක (රු.200,000/-) ක මුදලක් ඉල්ලා සිටි බැවින් එම මුදල ඉතාමත් යුක්ති සහගත හා සාධාරණ

බවට තීරණය කරමි. විශේෂයෙන් ම ඉල්ලුම්කරු විසින් වසර ගණනාවක් ඉතා දුර බැහැර සිට සහභාගී වූ බැවින් ද, නඩුවට ඉතා ඕනෑකමින් සූදනමින් සිටි බැවින් ද ඔහු වෙත පූර්ණ හා අවසාන වශයෙන් රුපියල් ලක්ෂ දෙක (රු.200,000/-) ක මුදලක් ප්‍රදානය කිරීම සාධාරණ හා යුක්ති සහගත බවට තීරණය කරමි.

විශේෂයෙන් ම මෙම නඩු විභාගයේ දී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ශානිකා ගාල්ලගේ මහත්මිය ඉතා උද්යෝගයෙන් නඩු විභාගයට මෙන් ම සමථයක් සඳහා ද ක්‍රියාකාරීව ගන්නා ලද උත්සාහය වගඋත්තරකරුවන්ගේ ආයතනය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති රෙගුලාසි සහ පැවැත්ම ඉදිරියේ ප්‍රායෝගික නොවන බවට මම ප්‍රත්‍යක්ෂ කර ගතිමි.

ප්‍රදනය

නඩු විභාගයේ දී දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සහ කරුණු ද විශේෂයෙන් වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරු වෙත එවන ලද ලිපි ලේඛන ද සළකා බැලීමේ දී වගඋත්තරකාර පාර්ශ්වය නඩු විභාගයකට මුහුණ දීමට සූදානම් නොමැති බව ප්‍රත්‍යක්ෂ විය. සමථය සම්බන්ධයෙන් පෙර සාකච්ඡා කරන ලද පරිදි රුපියල් ලක්ෂ දෙක (රු.200,000/-) ක මුදලක් පූර්ණ හා අවසාන ගෙවීමක් ලෙස ඉල්ලුම්කරුට ලබා ගැනීමට හැකි බවට තීරණය කරමි.

පැමිණිලි පක්ෂය විසින් ඉල්ලීමට අදාළව ඉදිරිපත් කළ කරුණු අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කරුගේ ආයාචනය පරිදි ඉල්ලීම ලබාදීම සාධාරණ හා යුක්ති සහගත බවයි. තව ද *ගැසට් කිරීමෙන්* මාසයක් ඇතුළත මෙම මුදල නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට නියෝග කරමි.

එස්. එම්. එස්. ජයවර්ධන
බේරුම්කරු

2022.12.07 වන දින කාර්මික අධිකරණයේ දීය.

EOG 01- 0057